ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
මහජන ආරක්ෂක හා පාලර්මේන්තු කටයුතු අමාත්‍යාංශය
ආගමන හා විගමන දෙපාතර්මේන්තුව

# ලංසු ආරාධනය

**ආගමන හා විගමන දෙපාතර්මේන්තුව වෙත UPS 11ක් සැපයීමේ, බෙදීමේ, ස්ථාපිත කිරීමේ සහ බලය පැවරීමේ ප්‍රසම්පාදනය**

**IFB අංකය:DIE/PRO/06/2025/19**

1. ආගමන හා විගමන දෙපාතර්මේන්තුව වෙනුවෙන් දෙපාතර්මේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් **මහනුවර, මාතර, වව්නියාව, යාපනය සහ කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාල සහ ගාල්ල, හම්බන්තොට, කන්කසන්තුරේ, කොළඹ, ත්‍රිකුණාමලය වරායන් සහ පලාලි ගුවන් තොටුපලවෙත 20KVA UPS 05 ක්, 15KVA UPS 01ක් සහ 06KVA UPS 05ක්** සැපයීමේ, බෙදීමේ, ස්ථාපිත කිරීමේ සහ බලය පැවරීමේ ප්‍රසම්පාදනය සඳහා යෝග්‍යතා පූර්ණ සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

2. මෙම ලංසුකරණය ජාතික තරඟකාරී ලංසුකරණ ක්‍රියා පටිපාටිය(NCB) යටතේ පැවැත්වේ.

3. මේ පිළිබඳව උනන්දුවක් දක්වන යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන්හට වැඩිමනත් විස්තර සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව.3.00 දක්වා 0112 – 101559 දරන දුරකතන අංකය අමතා ලබා ගත හැකි අතර 4 වැනි ඡේදයේ සඳහන් ව ඇති ලිපිනයේ පිහිටි කාර්යාලයට පැමිණ හෝ දෙපාතර්මේන්තු වෙබ් අඩවිය වන www.immigration.gov.lk හරහා හෝ **2026.03.30** දින සිට **2026.04.24** දින දක්වා කාල පරිච්ඡේදය තුළ දී නොමිලේ ලංසු ලිපිලේඛන පරීක්ෂාව සිදු කළ හැක.

4. රුපියල් පන්දහසක (රු.5,000.00) ක ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවීමෙන් හා ලිඛිත අයදුම්පතක් බත්තරමුල්ල, ශ්‍රී සුභූතිපුර පාරේ, “සුහුරුපාය”, ආගමන හා විගමන දෙපාතර්මේන්තුවේ, 05 වන මහලේ,ප්‍රසම්පාදන අංශයේ නියෝජ්‍ය පාලක (ප්‍රසම්පාදන) වෙත ඉදිරිපත් කිරීමෙන් පසු, ඉංග්‍රීසි භාෂාවෙන් ඇති සම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක් මේ පිළිබඳව උනන්දුවක් දක්වන අයට **2026.03.30 දින සිට 2026.04.24 දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාල පරිච්ඡේදය තුළදී** මිල දී ගත හැක. ගෙවීම් කළ යුත්තේ මුදලිනි.

5. නිසි ලෙස සම්පූර්ණ කරන ලද ලංසු,“මුල් පිටපත”(Original) හා “අනුපිටපත“ (Duplicate) ලෙස පිටපත් දෙකකින් යුතුව වෙන වෙනමම කවරවල බහා එම කවර එකම කවරයක බහා මුද්‍රා තබා මෙම මුද්‍රා තැබූ කවරයේ වම්පස ඉහළ කෙළවරේ කොන්ත්‍රාත්තුවේ නම සහ IFB අංකය පැහැදිලිව සඳහන් කර 7 වැනි ඡේදයේ සඳහන් කර ඇති ලිපිනයට 2026.04.27 වැනි දින ප.ව.2.00ට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනවිත් බාරදීම හෝ සිදු කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු කැඳවීම අවසන් වූ වහාම, 4 වැනි ඡේදයේ සඳහන් ලිපිනයේ දී 2026.04.27 වැනි දින ප.ව. 2.00ට පැමිණීම සඳහා කැමැත්ත දක්වන ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරියේදී ලංසු විවෘත කරනු ලැබේ.

6. භාරදෙනු ලබන ලංසුව ලංසු භාරගන්නා අවසාන දින සිට දින අනූ එකක් (91) දක්වා හෝ ගැනුම්කරු විසින් නියම කරනු ලබන ඕනෑම දීර්ඝකරන කාල පරිච්ඡේදයක් සඳහා වලංගුභාවයෙන් යුක්ත විය යුතුය. සියලුම ලංසු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද, ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවකින් නිකුත් කරන ලද රුපියල් භාරලක්ෂයක් (රු. 400,000/-) වටිනා ලංසු සුරක්ෂණයක ආකාර බැංකු ඇපකරයක් සමඟ එවිය යුතුය.

7. **2026.04.09** වෙනි දින **පෙ.ව. 10.00**ට බත්තරමුල්ල, ශ්‍රී සුභූතිපුර පාරේ, “සුහුරුපාය”, ආගමන හා විගමන දෙපාතර්මේන්තුවේ, 07 වන මහලේ, පුහුණු ඒකකයේදී **පූර්ව ලංසු රැස්වීමක්** පැවැත්වෙනු ඇත.

**සභාපති,**
දෙපාතර්මේන්තු ප්‍රසම්පාදන කමිටුව,
05 වැනි මහල,
ආගමන හා විගමන දෙපාතර්මේන්තුව,
“සුහුරුපාය”,
ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල.